INSTITUTE OF CERTIFIED MANAGEMENT ACCOUNTANTS OF SRI LANKA

CMA

Incorporated by the
Act Parliament No. 23 of 2009

CAT

# සහතිකලත් ගිණුම්කරණ තාක්ෂණවේදී (CAT) අධ්‍යයන වැඩසටහන

## අත්පොත

ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය
ශ්‍රී ලංකා ජාතික වෘත්තීය කළමනාකරණ ගණකාධිකරණ ආයතනය

# සහතිකලත් ගිණුම්කරණ තාක්ෂණවේදී (CAT)

## අධ්‍යයන වැඩසටහන

2024 අප්‍රේල්

**ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය**
**කොළඹ 04, ශ්‍රී ලංකාව**

# පටුන


**CMA ශ්‍රී ලංකා ආයතනය පිළිබඳ කෙටියෙන්……………………………………………………………3**

**හැඳින්වීම...........................................................................................................4**

**අධ්‍යයන වැඩසටහනට ඇතුළත් වීම සඳහා අවශ්‍යතාව……………………………………………5**

**සිසුන් ලියාපදිංචි කිරීම…………………………………………………………………………5**

**CAT අධ්‍යන උපකාරක………………………………………………………………………7**

**ඉගෙනුම් විධි………………………………………………………………………………7**

**විභාග ව්‍යුහය...................................................................................................8**

**CAT අධ්‍යන වැඩසටහනේ විෂය නිර්දේශය..........................................................................11**

**CAT 1: මූල්‍ය ගිණුම්කරණය (FA)……………………………………………………………12**

**CAT 2: පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය (MA)……………………………………14**

**CAT 3: ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය (EM)…………………………………………16**

**CAT 4: ප්‍රමාණාත්මක ක්‍රම (QM)…………………………………………………………20**

**CAT 5: තොරතුරු තාක්ෂණය (IT)…………………………………………………………22**

## ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය

CMA ශ්‍රී ලංකා ආයතනය ස්ථාපිත කිරීම
නිර්මාතෘ - මහාචාර්ය ලක්ෂ්මන් ආර් වටවල
තාක්ෂණික සහය - CMA කැනඩා (දැන් CPA කැනඩා)
මූලික අරමුදල් යෙදවුම - කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (CIDA)

1999 වර්ෂයේදී ‘කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ සමාජය’ ලෙසින් ඇරඹි ආයතනය (CMA) කැනඩා (දැන් (CPA) කැනඩා) ආයතනයේ තාක්ෂණ සහය සහ කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනයේ (CIDA) මූල්‍ය සහය සහිතව එහි නිර්මාතෘ මහාචාර්ය ලක්ෂ්මන් ආර් වටවල මහතා විසින් 2000 වර්ෂයේ ජූනි මාසයේදී ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය(CMA ශ්‍රී ලංකා) 2009 අංක 23 දරන පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය කළමනාකරණ ගිණුම්කරණ ආයතනය ලෙස සංස්ථාපිත කරන ලදී. 2000 ජූනි මාසයේ එහි ආරම්භයේ සිට මේ දක්වා CMA ශ්‍රී ලංකා ආයතනය සිසුන් 20,000 කට අධික සංඛ්‍යාවක් සහ සාමාජිකයින් 2,750 කට වැඩි පිරිසක් සිටින ආයතනයක් බවට වර්ධනය වී ඇත. ආයතනය වෘත්තීය කළමනාකරණ ගණකාධිකරණ සුදුසුකමකට මගපෙන්වන එහි කළමනාකරණ ගිණුම්කරණමය වැඩසටහන් හරහා කළමනාකරණ ගණකාධිකරණය, මූල්‍ය ගිණුම්කරණය සහ මූල්‍යය, සහ ව්‍යාපාරික කළමනාකරණය පිළිබඳ අධ්‍යයන සහ භාවිතයන් ප්‍රවර්ධනය කරයි.

CMA ආයතනය රටවල් 135 ක් පුරා විසිරී ඇති වෘත්තීය ගිණුම්කරණ ආයතන180 කින් සමන්විත එමෙන්ම පොදු පරිචය, රාජ්‍ය, කර්මාන්ත, සේවා, වාණිජ්‍යය සහ අධ්‍යාපනය යන අංශ ආවරණය වන පරිදි මිලියන 3 කට අධික ගණකාධිකාරීවරුන්ගේ මුළු සාමාජිකත්වයක් ඇති ඉහළම සංවිධානයක් වන ගණකාධිකාරීවරුන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ (IFAC) සාමාජිකයෙකි. CMA ශ්‍රී ලංකා ආයතනය SAARC හි ඉහළම මණ්ඩලය වන දකුණු ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (SAFA) සාමාජිකයෙකු වන අතර එමගින් ඉන්දියාව, පකිස්ථානය, බංග්ලාදේශය, නේපාලය සහ ශ්‍රී ලංකාව යන රටවල වෘත්තීය ගිණුම්කරණ ආයතන සමග සහෝදරාත්මකව කටයුතු කරයි. ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (SAFA) අධ්‍යක්ෂ මණ්ඩලය තුළ CMA ශ්‍රී ලංකා ආයතනය නියෝජනය වන අතර SAFA හි සභාපතිත්වය CMA ශ්‍රී ලංකා ආයතනය මගින් නියෝජනය කරනු ලබයි. තවද, CMA ශ්‍රී ලංකා ආයතනය ආසියා සහ පැසිෆික් කලාපයේ වෘත්තීය ගිණුම්කරණ ආයතනවලින් සමන්විත ආසියානු සහ පැසිෆික් ගණකාධිකාරීවරුන්ගේ සන්ධානයේ (CAPA) ද සාමාජිකයෙක් වෙයි.

# හැඳින්වීම

ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය එහි වැඩසටහන් ගොනුව තුළට සහතිකලත් ගිණුම්කරණ තාක්ෂණවේදී (CAT) අධ්‍යයන වැඩසටහන ඇතුළත් කිරීමට තීරණය ඇත. මෙම අත්පොතෙහි CAT අධ්‍යයන වැඩසටහනෙහි කෙටි විග්‍රහයක සහ විෂය නිර්දේශය ඇතුලත් වේ.

CAT අධ්‍යයන වැඩසටහන අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සම්පූර්ණ කොට වාණිජ ධාරාවෙන් උසස්පෙළ සඳහා යොමු වී සිටින සිසුන්හට ප්‍රයෝජනවත් අයුරින් සකස් කර ඇත.

CAT අධ්‍යයන වැඩසටහනෙහි අරමුණ වන්නේ ගිණුම්කරණය, කළමනාකරණය, වාණිජ්‍යය සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ප්‍රධාන ක්ෂේත්‍ර පහක් සම්බන්ධයෙන් මූලික දැනුම සහ කුසලතාව සැපයීමයි. වාණිජ ධාරාව තුළින් උසස් අධ්‍යාපනයට (උසස් පෙළ) පහසුකම් සලසන අතරම එය සාර්ථකව සම්පූර්ණ කිරීම මගින් CMA ශ්‍රී ලංකා වෘත්තීය වැඩසටහනට ප්‍රවේශ වීමේ මාර්ගයක් ඔවුන් වෙත පිරිනමනු ලබයි. තවදුරටත්, අධ්‍යයන වැඩසටහන තුළ පුළුල් පරාසයක න්‍යායාත්මක සහ ප්‍රායෝගික අංශ ආවරණය වන බැවින් වාණිජ්‍ය ක්ෂේත්‍රයන් තුළ කණිෂ්ඨ මට්ටමේ රැකියා සඳහා ඔවුන්ට ඇති අවස්ථාවන් වැඩිදියුණු කරනු ලබයි.

CAT අධ්‍යයන වැඩසටහන අධ්‍යයන වැඩසටහන් පහකින් සමන්විත වෙයි. (එනම් CAT 1: මූල්‍ය ගිණුම්කරණය, CAT 2: කළමනාකරණ ගිණුම්කරණය, CAT 3: ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය, CAT 4: ප්‍රමාණාත්මක ක්‍රම සහ කුසලතා පාඨමාලාව වන CAT 5: තොරතුරු තාක්ෂණය වශයෙනි.) මාස 9ක් තුළ (ආසන්න වශයෙන් සති 36ක්) පවත්වා ගෙන යන එක් එක් පාඩම් ඒකකය පැය 60ක කාලයක් සහ පැය තුනක ඇගයීම් කාලයකින් යුක්තය.

පාඨමාලාව පවත්වා ගෙන යනු ලබන්නේ ලියාපදිංචි අධ්‍යාපනික ආයතන විසින් වන අතර ඇගයීම CMA ශ්‍රී ලංකා ආයතනයේ වගකීම යටතේ සිදු වෙයි. අධ්‍යයන සැසි පැවැත්වීම පවත්නා පහසුකම් සහ අධ්‍යාපනික සේවා සපයන්නන්ගේ ප්‍රතිපත්තිය මත පදනම්ව භෞතිකව, මාර්ගගතව හෝ සංයෝගී ආකාරයට සිදුවෙයි. සම්පත් දායකයින්ගේ සහ සිසුන්ගේ භාවිතය සඳහා එක් එක් පාඨමාලාව වෙනුවෙන්වූ අධ්‍යයන පෙළපොත් සහ නියාමක ප්‍රශ්න පත්‍ර CMA ශ්‍රී ලංකා ආයතනය විසින් සපයනු ලබයි. අධ්‍යයන වැඩසටහන සාර්ථක ලෙස නිම කළ සිසුන් හට සහතිකලත් ගිණුම්කරණ තාක්ෂණවේදී සහතිකය පිරිනමනු ලබයි. එසේම එය CMA ශ්‍රී ලංකා ආයතනයේ වෘත්තීය වැඩසටහන් සඳහා ප්‍රවේශ සුදුසුකමක් ද වෙයි.

## CAT අධ්‍යයන වැඩසටහනට ඇතුළත්වීම සඳහා අවශ්‍යතාව

අධ්‍යයන පොදු සහතපත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් සහ උසස් පෙළ අධ්‍යයනය කරන සිසුන්

## සිසුන් ලියාපදිංචි කිරීම

### නවක සිසුන් ලියාපදිංචි කිරීම

CMA නවක සිසුන් ලියාපදිංචි කිරීම සම්පූර්ණයෙන්ම මාර්ගගත ක්‍රමය හරහා සිදුවෙයි. ස්වයං-ලියාපදිංචි කිරීමේ අන්තර්ජාල ප්‍රවේශය හරහා ලියාපදිංචිකිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලෙස සිසුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මාර්ගගත ලියාපදිංචිවීමේ ක්‍රියාපටිපාටිය ආරම්භ කිරීමට පෙර ඔබ විසින් ප්‍රමාණවත් ලෙස සූදානම් වීම අත්‍යාවශ්‍ය වෙයි.

පියවර 1: CMA නිල වෙබ් අඩවියේ ‘නව ශිෂ්‍ය ලියාපදිංචිය ‘ සබැඳිය භාවිතා කරන්න.

↓

පියවර 2: වැඩසටහන තෝරා ගැනීම - CAT වැඩසටහන ( සහතිකලත් ගිණුම්කරණ තාක්ෂණවේදී)

↓

පියවර 3: මූලික විස්තර ඇතුළත් කර ලියාපදිංචිය සඳහා වූ ගාස්තු ගෙවීම.

↓

පියවර 4: විස්තර ඇතුළත් කිරීම සඳහා ශිෂ්‍ය විද්‍යුත් තැපැල පිළිබඳ සබැඳිය භාවිතා කරන්න. ලියාපදිංචි වීමේ ඉල්ලුම් පත සම්පූර්ණ කිරීම සඳහා උපකාරක ලේඛන උඩුගත කරන්න.

↓

පියවර 5: CMA ශිෂ්‍ය කටයුතු අංශය මගින් ලියාපදිංචිවීමේ ඉල්ලුම් පත්‍රය තහවුරු කිරීම.

↓

පියවර 6: සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍ර කළමනාකරු - ශිෂ්‍ය කටයුතු විසින් අනුමත කරනු ලැබීම.

↓

පියවර 7: ලියාපදිංචි අංකයක් සහ MYCMA ගිණුමට ඇතුල්වීමේ උපදෙස් සමග ලියාපදිංචිය ස්ථිර කිරීම සඳහා ස්වයංක්‍රීය විද්‍යුත් පණිවිඩයක් ශිෂ්‍ය විද්‍යුත් තැපැලට යවනු ලබයි.

## ලේඛන සූදානම් කරගැනීම

මාර්ගගත ලියාපදිංචිය ආරම්භ කිරීමට පෙර කරුණාකර පහත දැක්වෙන ලේඛන පරිලෝකනය කොට (scan) ඔබගේ පරිගණකයේ සුරැකිව ඇති බවට තහවුරු කරගන්න.

- ඔබගේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සහතිකයේ සහතික කළ ඡායා පිටපතක (pdf, jpg, jpeg) මෘදු පිටපතක්.

- ඔබගේ උප්පැන්න සහතිකයේ සහතික කළ ඡායා පිටපතක (pdf, jpg, jpeg) මෘදු පිටපතක් (වැදගත්: තම උප්පැන්න සහතිකයේ දෙමළ පිටපතක් ඇති සිසුන් එහි ඉංග්‍රීසියට හෝ සිංහලට පරිවර්තනය කළ පිටපතක් උඩුගත කළයුතුය.).

- ඔබගේ ජාතික හැඳුනුම් පතෙහි සහතික කළ ඡායා පිටපතක (pdf, jpg, jpeg) මෘදු පිටපතක්.

- ශිෂ්‍ය හැඳුනුම් පත සූදානම් කිරීම සඳහා සෙන්ටි මීටර් 3.0 x 2.5 ප්‍රමාණයේ උඩුකය ඡායාරූපයක (jpg, jpeg) මෘදු පිටපතක් අවශ්‍ය වේ.

## ලියාපදිංචි කිරීමේ ගාස්තුව

ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවීම සඳහා ඔබට කැමති ක්‍රමයක් තෝරා ගැනීමට හැකියාව ඇත. පහත දැක්වෙන ගෙවීම් විකල්ප පවතී.

**විකල්ප 1.**

**බැර හෝ හර කාඩ්පත් භාවිතාකරමින් ගෙවීම:** ඔබගේ බැර හෝ හර කාඩ්පත් භාවිතා කරමින් මාර්ගගත ගෙවීම් ක්‍රමය හරහා ආරක්ෂිතව ගෙවීම කළහැකිය. ඔබගේ ඉල්ලුම් පත සැකසීමට පෙර ඔබගේ බැර හෝ හර කාඩ්පත් සූදානම්ද යන්න තහවුරු කරගන්න.

**විකල්ප 2.**

**මහජන බැංකුව හරහා ගෙවීම:** මහජන බැංකු කුවිතාන්සියක් ඔබගේ විද්‍යුත් තැපෑලට එවනු ලබයි. සිසුන් විසින් නිසි ලෙස සම්පූර්ණ කළ මහජන බැංකු තැන්පතු පත්‍රිකාවක් සමග තැන්පතු කුවිතාන්සියේ මුද්‍රිත හෝ මෘදු පිටපතක් බැංකුව වෙත ඉදිරිපත් කළයුතුය.

**විකල්ප 3.**

**CMA ආයතනයට ගෙවීම:** බැර හෝ හර කාඩ්පත් මගින් පමණක් CMA ආයතනයට පැමිණ ගෙවීම කළහැකිය. මුදල් භාරගනු නොලැබේ.

ඔබගේ ලියාපදිංචිය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමත් සමග ඔබගේ CMA ලියාපදිංචි අංකය සහ MYCMA ගිණුමට ප්‍රවේශ වීමේ පැහැදිලි උපදෙස් ඇතුළත් විද්‍යුත් පණිවිඩයක් ඔබට ලැබෙනු ඇත.

පහතින් දී ඇති උපදෙස් අනුව කරුණාකර MYCMA ගොනුවට ඇතුළත් වන්න.

**සබැඳිය**: https://cm.cma-srilanka.org/login
**පරිශීලක නාමය**: ඔබගේ CMA ලියාපදිංචි අංකය. උදා: **CAT35000**
**මුරපදය**: "Retrieve Password" සබැඳිය click කිරීම මගින් ඔබගේ මුරපදය ලබා ගන්න. (නව මුරපදය සැකසීමේ සබැඳියක් ඔබගේ විද්‍යුත් ලිපිනයට ලැබෙනු ඇත).

ඔබගේ විස්තර පරීක්ෂාකර නිවැරදි කළයුතු යමක් වේනම් MYCMA ගිණුම යාවත්කාලීන කරන්න.

ඔබගේ නමෙහි සහ හැඳුනුම් පත් අංකයෙහි යම් වරදක් ඇත්නම් info@cma-srilanka.org. වෙත විද්‍යුත් පණිවිඩයක් එවන්න.

යාවත්කාලීන කළ සියලු CMA වැඩසටහන් ලබාගැනීම සඳහා ඔබගේ සම්බන්ධිත තොරතුරුවල යම් වෙනසක් වේ නම් MYCMA ගිණුම යාවත්කාලීන කරගන්න.

### ගෙවීම් ව්‍යුහය - 2024

2024 වර්ෂය සඳහා අදාල ගෙවීම් ව්‍යුහය පහතින් දක්වා ඇත.

| | |
|---|---|
| ලියාපදිංචිවීමේ ගාස්තුව | රු. 3,000 |
| විෂයයක් සඳහා විභාග ගාස්තුව | රු. 1,750 |
| විෂයයක් සඳහා අධ්‍යයන පැකේජ ගාස්තුව | රු. 1,500 |

## CAT අධ්‍යයන උපකාරක

එක් එක් විෂය සඳහා සිංහල සහ ඉංග්‍රීසි CAT අධ්‍යයන පැකේජයන් CMA ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැකිය.

## ඉගෙනුම් විධි

### ලියාපදිංචි අධ්‍යාපන සේවා සපයන්නන්

සිසුන්හට CMA ශ්‍රී ලංකා ආයතනයේ ලියාපදිංචි අධ්‍යාපන සේවා සපයන්නන්ගේ දේශනවලට සහභාගි විය හැකිය. ලියාපදිංචි ආයතනවල නාමලේඛනයක් CMA ශ්‍රී ලංකා වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. CAT සඳහා දේශන කාලය මාස 9කි.

**වැදගත් දින**

| | |
|---|---|
| ලියාපදිංචිය අවසන් වන දිනය | 2024 අගෝස්තු 31 |
| CAT විභාග සඳහා අයදුම් කිරීමේ අවසන් දිනය | 2025 ජනවාරි 31 |
| CAT විභාග පැවැත්වෙන දින | 2025 අප්‍රේල් 25 සහ 26 |

## විභාග ව්‍යුහය

### CAT වැඩ සටහනෙහි විෂයයන්: විභාග ව්‍යුහය

| කේතය | විෂය | මාධ්‍යය | විභාග කාලය | ඇගයීම් ක්‍රමය |
|---|---|---|---|---|
| **ප්‍රධාන** | | | | |
| CAT 1 | CAT 1: මූල්‍ය ගිණුම් කරණය (FA) | ඉංග්‍රීසි/සිංහල/දෙමළ | පැය 3 | ලිඛිත ඇගයීම් |
| CAT 2 | CAT 2: පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය (MA) | ඉංග්‍රීසි/සිංහල/දෙමළ | පැය 3 | ලිඛිත ඇගයීම් |
| CAT 3 | CAT 3: ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය (EM) | ඉංග්‍රීසි/සිංහල/දෙමළ | පැය 3 | ලිඛිත ඇගයීම් |
| CAT 4 | CAT 4: ප්‍රමාණාත්මක ක්‍රම (QM) | ඉංග්‍රීසි/සිංහල/දෙමළ | පැය 3 | ලිඛිත ඇගයීම් |
| **කුසලතා** | | | | |
| CAT 5 | තොරතුරු තාක්ෂණ යෙදවුම් | ඉංග්‍රීසි | පැය 3 | ප්‍රායෝගික ඇගයීම් |

### ඇගයීම
ඕනෑම ප්‍රධාන හෝ කුසලතා පාඩම් ඒකකයක සමත් ලකුණ 50ක් වන අතර ශ්‍රේණි පිළිවෙල පහතින් දක්වා ඇත. කුසලතා පාඩම් ඒකකයන්හි සමත් ලකුණ 50ක් වන අතර ඇගයීම් ශ්‍රේණිය වන්නේ සමත් හෝ අසමත් යන්නයි.

### ශ්‍රේණි පිළිවෙල

| | |
|---|---|
| A | විශිෂ්ඨ සාමාර්ථය |
| B | සතුටුදායක සාමාර්ථය |
| C | සමත් ප්‍රමිතිය |
| D | ආන්තික |
| E | අසමත් |
| F | අධි අසමත් |

### විභාග ප්‍රතිඵල
CAT විභාගයේ ප්‍රතිඵල විභාගය අවසන්ව දින 50ක් ඇතුළත නිකුත් කරනු ලැබේ. ප්‍රතිඵල නිකුත් කළ සැණින් MYCMA ගිණුමට පිවිසීමෙන් සිසුන්හට තම ප්‍රතිඵල දැකගත හැකි අතර පද්ධති ගතකළ සවිස්තරාත්මක ප්‍රතිඵල සටහනක් විද්‍යුත් තැපැල හරහා සිසුන් වෙත යොමු කරනු ලැබේ. මුල් ප්‍රතිඵල සටහන සියලුම සිසුන් වෙත තැපැල් මගින් යවනු ලැබේ.

### 2023 – 2027 CMA වෘත්තීය වැඩසටහන සඳහා ගණක යන්ත්‍ර භාවිතය පිළිබඳ මගපෙන්වීම්
ගණක යන්ත්‍ර භාවිතය සඳහාවූ පහත සඳහන් මගපෙන්වීම් CAT වැඩසටහන සඳහාද අදාල වෙයි.

### අවසරලත් ගණක යන්ත්‍ර වර්ග:
- CAT වැඩසටහනේ ප්‍රධාන විෂයයන් සඳහා විද්‍යාත්මක සහ ක්‍රමලේඛනගත කළ නොහැකි (Nonprogrammable)ගණක යන්ත්‍ර භාවිතා කිරීමට සිසුන්හට අවසර දෙනු ලැබේ.

### අවසර නොලත් ගණක යන්ත්‍ර වර්ග

- පාඨ ඇතුළත් හෝ අකුරු සහ සංඛ්‍යා දෙවර්ගයම ඇතුළත් දත්ත ගබඩා කිරීමේ හැකියාව ඇති ක්‍රමලේඛනගත කළ හැකි ඕනෑම ගණක යන්ත්‍රයක්.
- අවකලනය, සංකලනය, වීජීය ප්‍රකාශන, සමීකරණ විසඳුම් වැනි ක්‍රියාකාරකම් කළහැකි ඕනෑම ක්‍රමලේඛනගත කළ හැකි ගණක යන්ත්‍ර.
- බාහිර සන්නිවේදන ලක්ෂණ සහිත හෝ අන්තර්ජාල සම්බන්ධතා ඇති ගණක යන්ත්‍ර.
- ජංගම දුරකථන සතු ගණක යන්ත්‍ර.

### පූර්ව අනුමැතිය ඇති ගණක යන්ත්‍ර ලැයිස්තුව

ප්‍රස්තාර ඇඳීම කළ නොහැකි හෝ ප්‍රස්තාර ආකෘතීන් නොමැති Casio fx මාදිලි - උදා:

- fx – 100 MS
- fx – 991 ES PLUS
- fx – 991 MS
- fx – 82 MS
- fx – 82 ES PLUS

### සිසුන්ට වැදගත් සටහනක්:

අවසරලත් ගණක යන්ත්‍ර භාවිතය හුරුවීම සහ විභාග දිනයේදී ගණක යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය තහවුරු කර ගැනීම සිසුන්ගේ වගකීම වෙයි.
උදා: බැටරි ක්‍රියාකාරිත්වය, සූර්ය බලය ආදිය.

### සහතික ප්‍රදානය කිරීම

එක් එක් අදියර සම්පූර්ණ කරන සිසුන්හට පහත සඳහන් පරිදි ප්‍රතිඵල සටහනට අමතරව ‘සහතිකලත් ගිණුම්කරණ තාක්ෂණවේදී‘ සහතිකය නිකුත් කරනු ලැබේ.

#### ත්‍යාග

සෑම විෂයයකටම ත්‍යාග පිරිනමනු ලබයි. පළමුවන උත්සාහයේදී විශිෂ්ඨ මට්ටමේ ඉහළම ලකුණු ලැබූ සිසුන්හට විශිෂ්ඨත්ව ත්‍යාග පිරිනමනු ලබයි. එක් එක් අදියරේදී විශිෂ්ඨත්ව ත්‍යාග තුනක් පිරිනමනු ලැබේ.
පළමු උත්සාහයේදී එක් එක් විෂය සඳහා විශිෂ්ඨත්ව මට්ටමේ ඉහළම ලකුණු ලැබූ සිසුන්හට ප්‍රධාන සහ කුසලතා විෂයයන් සඳහා විෂය ත්‍යාග පිරිනමනු ලැබේ.

### ඇමතුම් විස්තර

| අංශය | දිගුව | ජංගම | වට්ස්ඇප් | විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|---|
| ශිෂ්‍ය කටයුතු අංශය | 110<br>132<br>144 | 0778833363<br>0774526206 | 0778833363 | studentaffairs@cma-srilanka.org |
| අධ්‍යාපන සහ පුහුණු අංශය | 154<br>145<br>139 | 0706930446<br>0743213860 | 0743213860 | education@cma-srilanka.org |
| විභාග අංශය | 123<br>137 | 0770-584753<br>0770-418339 | 0770-584753 | cmaexaminations@cma-srilanka.org |
| අලෙවිකරණ අංශය | 134 | 0777 593 562<br>0766 375 456<br>0778 802 522 | 0778 802 522 | promotion@cma-srilanka.org |
| පරිගණක අංශය | 117 | 0770574893 | | computercenter@cma-srilanka.org |

# සහතිකලත් ගිණුම්කරණ තාක්ෂණවේදී
# (CAT)
# විෂය නිර්දේශය

## සහතිකලත් ගිණුම්කරණ තාක්ෂණවේදී (CAT) අධ්‍යයන වැඩසටහන

### ප්‍රධාන පාඨමාලා

CAT 1: මූල්‍ය ගිණුම්කරණය (FA)

CAT 2: පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය (MA )

CAT 3: ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය (EM )

CAT 4: ප්‍රමාණාත්මක ක්‍රම (QM )

### කුසලතා පාඨමාලා

CAT 5: තොරතුරු තාක්ෂණය (IT)

## ප්‍රධාන පාඨමාලා

### CAT 1: මූල්‍ය ගිණුම්කරණය (FA)

මූල්‍ය ගිණුම්කරණය යනු ව්‍යාපාරයකට සම්බන්ධ මූල්‍ය ගනුදෙනු සාරාංශ කිරීම, විශ්ලේෂණය සහ වාර්තාකරණයට අදාල ගිණුම්කරණ අංශයකි. කොටස්හිමියන්, සේවකයින්, බැංකු, රාජ්‍ය ආයතන සහ සැපයුම්කරුවන් වැනි උනන්දු පාර්ශවයන්ගේ භාවිතය සඳහා සැපයිය යුතු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම මෙයට ඇතුළත් වෙයි. මෙම පාඩම් ඒකකයේ අරමුණ වන්නේ සිසුන්හට මූල්‍ය ගිණුම්කරණය, ගිණුම්කරණ ක්‍රියාවලිය සහ මූල්‍ය ප්‍රකාශන අර්ථ නිරූපණය කිරීම සම්බන්ධ සංකල්ප සහ මූලධර්ම පිළිබඳව මූලික අවබෝධයක් ලබා දීමයි.

**ඉගෙනුම් ඵල**

මෙම පාඩම් ඒකකය සාර්ථකව සම්පූර්ණ කිරීමත් සමග සිසුන්හට;

a) මූල්‍ය ගිණුම්කරණයේ සංකල්ප සහ මූලධර්ම විස්තර කිරීමට,
b) ගිණුම්කරණ ක්‍රියාවලිය පැහැදිලි කිරීමට,
c) මූලික ගිණුම් ප්‍රකාශන කට්ටලයක් අර්ථනිරූපණය කිරීමට,
d) ගිණුම්කරණය පිළිබඳ උසස් අධ්‍යයනයන් කිරීමේ හැකියාව නිරූපණය කිරීමට හැකි වනු ඇත.

**පාඩම් ඒකකයේ ස්වභාවය:** අනිවාර්ය, එකිනෙකට බලපාන පැයවලින් යුත් පැය හැටකින් සමන්විත වෙයි.

**විෂය නිර්දේශ ව්‍යුහය**

| අංශය | ක්ෂේත්‍රය | බරතැබීම (%) | කාලය පැය |
|---|---|---|---|
| I. | ගිණුම්කරණය සහ මූලික සංකල්ප සහ මූලධර්ම හඳුන්වාදීම | 25 | 15 |
| II. | ගිණුම්කරණ ක්‍රියාවලිය | 50 | 30 |
| III. | මූල්‍ය ප්‍රකාශන සහ අර්ථනිරූපණය | 25 | 15 |

**I. ගිණුම්කරණය සහ මූලික සංකල්ප සහ මූලධර්ම හඳුන්වාදීම (25% - පැය 15)**

ව්‍යාපාරයක උනන්දු පාර්ශවයන් සහ ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාව; ව්‍යාපාරික සංවිධාන වර්ග; තොරතුරු පද්ධතියක් ලෙස ගිණුම්කරණය; ගිණුම්කරණයේදී මෘදුකාංග භාවිතය. ආස්ථිතා සංකල්පය, ගිණුම්කරණ සමීකරණය, වත්කම්, වගකීම් සහ ප්‍රාග්ධනය සහ ගනුදෙනු අර්ථකතනය; ද්විත්ව සංකල්පය, ද්විත්ව සටහන් ක්‍රමය සහ ද්විත්ව සටහන් මූලධර්මය අනුව ගනුදෙනු වාර්තා කිරීම; මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පිළිපදින ගිණුම්කරණ සංකල්ප සහ මූලධර්ම.

**II. ගිණුම්කරණ ක්‍රියාවලිය (50% - පැය 30)**

ගිණුම්කරණ යෙදවුම, ක්‍රියාවලිය සහ නිමැවුම: මූලාශ්‍ර ලියවිලි, ප්‍රාථමික සටහන් පොත්, මුදල් පොත, පොදු ලෙජරය සහ මූල්‍ය ප්‍රකාශන.

මුදල් පොත සහ සුළු මුදල් පොත: මුදල් ලැබීම් සහ ගෙවීම්; ණයට විකුණුම් සහ ණයට ගැනුම් (ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්) - දින පොත් (විකුණුම්, මිලදී ගැනුම්, විකුණුම් ආපසු එවුම්, ගැනුම් ආපසු යැවුම්) : පොදු ලෙජරයේ ගනුදෙනු වාර්තා කිරීම: පොදු ලෙජරයේ සටහන් තැබීම, ලෙජර් ගිණුම් තුලනය සහ පියවීම, ශේෂ පිරික්සුම උපුටා ගැනීම - වැරදි නිවැරදි කිරීම: උපයෝගී ලෙජර් සහ පාලන ගිණුම්: මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම: ගැලපුම් සටහන් (අවසාන තොගය, ක්ෂය කිරීම, බොල් ණය, උපචිත වියදම් සහ ආදායම්, කලින් ගෙවූ වියදම් සහ ආදායම්, තොග අලාභ), බදු වියදමක් ලෙස.
නිෂ්පාදන ගිණුම සහ එය පිළියෙල කිරීම.
බැංකු සැසඳුම් ප්‍රකාශනය සහ එය පිළියෙල කිරීම.

### III. මූල්‍ය ප්‍රකාශන සහ අර්ථනිරූපණය (25% - පැය 15)

තනි පුද්ගල ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ව්‍යුහය සහ මූලිකාංග).
මූල්‍ය අනුපාත සහ අර්ථනිරූපණය කිරීම (ලාභදායිතාව, ද්‍රවශීලතාව සහ වත්කම් කළමනාකරණ කාර්යක්ෂමතාව)
තනි පුද්ගල ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන සීමිත වගකීම් සමාගමක /හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන සමග සැසඳීම

### ඇගයීම

පාඩම් ඒකකය අවසානයේදී පහත සඳහන් සංයෝගය සහිතව පැය තුනක ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

| ක්‍රමය | ලකුණු |
|---|---|
| බහුවරණ ප්‍රශ්න 25ක් | 50 |
| එක් අනිවාර්ය ප්‍රශ්නයක් | 20 |
| ප්‍රශ්න හතරකින් දෙකක් - එකකට ලකුණු 15 බැගින් | 30 |
| **මුළු ලකුණු** | **100** |

### *ඉගෙනුම් ආධාරක*

***මූල්‍ය ගිණුම්කරණය පිළිබඳ අධ්‍යයන පැකේජය,*** *CMA Sri Lanka, 2024*
*Miller-Nobles, T & Mattison, B 2020,* ***Horngren's Accounting*** *(13th ed.), Pearsons's Education Ltd. Essex.*

## CAT 2: පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය (MA)

පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය ආදායම් සහ වියදම් පිළිබඳ ඵලදායි කළමනාකරණය මගින් ප්‍රශස්ත කාර්යසාධනය ඉලක්ක කරගත් ගිණුම්කරණ ආකෘතියකි. මේ අනුව කළමනාකරණ ගිණුම්කරණය සැලසුම් කිරීම, තීරණ ගැනීම සහ පාලනය යන කළමනාකරණ කාර්යයන් හා සම්බන්ධවන අතර පිරිවැය ගිණුම්කරණය ව්‍යාපාරයෙහි පිරිවැය ව්‍යුහය වෙත යොමු වෙයි. මෙම පාඩම් ඒකකයේ අරමුණ වන්නේ සිසුන්හට පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ සංකල්ප සහ මූලධර්ම මෙන්ම තෝරාගත් යෙදවුම් සම්බන්ධ මූලික අවබෝධයක් ලබා දීමයි.

### ඉගෙනුම් ඵල

පාඩම් ඒකකය සාර්ථකව සම්පූර්ණ කිරීමත් සමග සිසුන්හට;

a) පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණයේ මූලධර්ම සහ සංකල්ප විස්තර කිරීමට,
b) පිරිවැය ගිණුම්කරණයේ තෝරාගත් යෙදවුම් පැහැදිලි කිරීමට,
c) කළමනාකරණ ගිණුම්කරණයේ තෝරාගත් යෙදවුම් පැහැදිලි කිරීමට,
d) පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණයේ උසස් අධ්‍යයනයන් කරගෙන යාමේ හැකියාව විදහා දැක්වීමට හැකිවනු ඇත.

**පාඩම් ඒකකයේ ස්වභාවය:** අනිවාර්ය, එකිනෙකට බලපාන පැයවලින් යුත් පැය හැටකින් සමන්විත වෙයි.

### විෂය නිර්දේශ ව්‍යුහය

| අංශය | ක්ෂේත්‍රය | බරතැබීම (%) | කාලය පැය |
|---|---|---|---|
| I. | පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය හඳුන්වාදීම | 15 | 09 |
| II. | පිරිවැය සංකල්පය, පිරිවැය වර්ගීකරණය සහ විශ්ලේෂණය | 40 | 24 |
| III. | පිරිවැයකරණ විධි සහ පිරිවැය ගණනය කිරීම | 25 | 15 |
| IV. | සැලසුම් කිරීම සහ කෙටිකාලීන තීරණ ගැනීමේ ශිල්පීයක්‍රම | 20 | 12 |

### I. පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය හඳුන්වාදීම (15% - පැය 09)

පිරිවැය ගිණුම්කරණයේ සහ කළමනාකරණ ගිණුම්කරණයේ භූමිකාව සහ කාර්යයන්; පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණ තොරතුරු පරිශීලකයින්; මූල්‍ය ගිණුම්කරණය, පිරිවැය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් වෙන්කොට දැක්වීම; පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණයේදී මෘදුකාංග භාවිතය.

### II. පිරිවැය සංකල්පය, පිරිවැය වර්ගීකරණය සහ විශ්ලේෂණය (40% - පැය 24)

අදාල පිරිවැය යෙදුම් සහ සංකල්ප නිර්වචනය කිරීම (පිරිවැය විෂය, පිරිවැය ඒකකය, පිරිවැය මූලිකාංග - ද්‍රව්‍ය, ශ්‍රමය සහ වියදම්, ඍජු සහ වක්‍ර පිරිවැය, පොදුකාර්ය: කාලච්ඡේද සහ නිෂ්පාදිත; චර්යාව අනුව පිරිවැය - විචල්‍ය, ස්ථාවර, අර්ධ විචල්‍ය, අර්ධ ස්ථාවර, අදාල සහ අදාල නොවන පිරිවැය, ආවස්ථික පිරිවැය සහ ගිලුණු පිරිවැය)

ද්‍රව්‍ය සඳහා ගිණුම්කරණය: ද්‍රව්‍ය ප්‍රවාහය, ද්‍රව්‍ය මිලදී ගැනීම් සහ නිකුත්කිරීම් වාර්තා කිරීම, ද්‍රව්‍ය නිකුතුව මිල කිරීම (ප්‍රථම ලැබ ප්‍රථම නිකුත් කිරීම FIFO, අවසානයට ලැබ ප්‍රථම නිකුත් කිරීම LIFO), ද්‍රව්‍ය සඳහා පාලන ක්‍රියාවලිය (ආර්ථික ඇණවුම් ප්‍රමාණය EOQ, යළි ඇණවුම් මට්ටම, උපරිම සහ අවම තොග මට්ටම්)

ශ්‍රමය සඳහා ගිණුම්කරණය: තෝරාගත් ශ්‍රම ආශ්‍රිත පිරිවැය සඳහා සෘජු සහ වක්‍ර වර්ගීකරණය; ශ්‍රම පාරිශ්‍රමික විධි (කාල පදනම, කෑලි ක්‍රමයට ගෙවීම සහ දිරි දීමනා ක්‍රම).

පොදුකාර්ය සඳහා ගිණුම්කරණය: පොදුකාර්ය පිරිවැය ස්වභාවය; පොදුකාර්ය බෙදාහැරීම (වෙන් කිරීම, විභජනය, අන්තර්ග්‍රහණය / පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාත); සේවා පිරිවැය යළි බෙදාහැරීම; පොදුකාර්ය අධි / ඌන අන්තර්ග්‍රහණය සහ ඒවායේ ප්‍රතිකර්ම.

පිරිවැය පත්‍රිකා සහ ඒකක පිරිවැය ගණනය කිරීම (පොදුකාර්ය පිරිවැය ඇතුලුව)

## III. පිරිවැයකරණ විධි සහ පිරිවැය ගණනය කිරීම (25% - පැය 15)

නියත ඇණවුම් පිරිවැය එරෙහිව අඛණ්ඩ මෙහෙයුම් පිරිවැය - නිෂ්පාදනය සහ පිරිවැය ප්‍රවාහය; කාර්ය පිරිවැය සහ කාණ්ඩ පිරිවැය (ස්වභාවය, මුලු පිරිවැය සහ ඒකක පිරිවැය ගණනය කිරීම); පෙරසැරි පිරිවැය (ස්වභාවය, සාමාන්‍ය සහ අසාමාන්‍ය පාඩු, සම්පූර්ණ වූ සියලු නිමැවුම් සමග අනුගාමී පෙරසැරිකරණය), ඒකක පිරිවැය ගණනය කිරීම.

## IV. සැලසුම් කිරීම සහ කෙටිකාලීන තීරණ ගැනීමේ ශිල්පීයක්‍රම (20% - පැය 12)

අයවැයකරණය: ස්වභාවය, භූමිකාව සහ අරමුණ; අයවැයකරණ ක්‍රියාවලියේ අවස්ථා; ශ්‍රිතීය අයවැය සහ උපාංග; අයවැය පාලනය (ගණනය කිරීම්වලින් බැහැරව)

පිරිවැය-පරිමා-ලාභ විශ්ලේෂණය: සමායන ලක්ෂ්‍යය - BEP (ඒකක සහ අදායම), ආරක්ෂිත අන්තය - MS, සමායන සටහන සහ ලාභ-පරිමා සටහන, ඉලක්කගත ලාභය ගණනයකිරිම, යෙදවුම්, සීමාවන් සහ උපකල්පන.

### ඇගයීම

පාඩම් ඒකකය අවසානයේදී පහත සඳහන් සංයෝගය සහිතව පැය තුනක ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

| ක්‍රමය | ලකුණු |
|---|---|
| බහුවරණ ප්‍රශ්න 25ක් | 50 |
| එක් අනිවාර්ය ප්‍රශනයක් | 20 |
| ප්‍රශ්න හතරකින් දෙකක් - එකකට ලකුණු 15 බැගින් | 30 |
| **මුලු ලකුණු** | **100** |

### *ඉගෙනුම් ආධාරක*

*පිරිවැය සහ කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ අධ්‍යයන පැකේජය - Study Pack on Cost and **Management Accounting**, CMA Sri Lanka, 2024*

*Drury, C and Tayles, M 2021, **Management and Cost Accounting** (11th ed.), Cenagage Learning Hampshire.*

# CAT 3: ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය (EM)

මෙම පාඩම් ඒකකය කොටස් දෙකකින් සමන්විත වෙයි. එනම් ආර්ථික විද්‍යාව (50% - පැය 30) සහ කළමනාකරණය (50% - පැය 30) වශයෙනි.

## ආර්ථික විද්‍යාව

ආර්ථික විද්‍යාව යනු නිෂ්පාදනය, පරිභෝජනය සහ ධනය හුවමාරුව සමග බැඳුනු දැනුමේ කොටසක් වෙයි. තවදුරටත්, ආර්ථික විද්‍යාවේ අංශයක් වූ ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව මගින් පුද්ගලයින් සහ ව්‍යාපාරික තීරණ අධ්‍යයනය කරන අතර සාර්ව ආර්ථික විද්‍යාව රටවල් සහ රජයන් මගින් ගනු ලබන තීරණ විශ්ලේෂණය කරයි. මෙම පාඩම් ඒකකයේ අරමුණ වන්නේ ක්ෂුද්‍ර සහ සාර්ව ආර්ථික විද්‍යාවන්හි සංකල්ප, මූලධර්ම සහ පරිචයන් පිළිබඳ මූලික අවබෝධයක් සිසුන්හට ලබාදීමයි.

## ඉගෙනුම් ඵල

මෙම පාඩම් ඒකකය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමත් සමග සිසුන්හට;

a) ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාවේ සංකල්ප සහ මූලධර්ම විස්තර කිරීමට,
b) සාර්ව ආර්ථික විද්‍යාවේ සංකල්ප සහ මූලධර්ම විස්තර කිරීමට,
c) ආර්ථික විද්‍යාව සම්බන්ධ උසස් අධ්‍යයනයන් කරගෙන යාමේ හැකියාව විදහා දැක්වීමට

හැකිවනු ඇත.

**පාඩම් ඒකකයේ ස්වභාවය**: අනිවාර්ය, එකිනෙකට බලපාන පැයවලින් යුත් පැය හැටකින් සමන්විත වෙයි.

## විෂය නිර්දේශ ව්‍යුහය

| අංශය | ක්ෂේත්‍රය | බරතැබීම (%) | කාලය පැය |
|---|---|---|---|
| I. | ආර්ථික විද්‍යාවේ මූලික සංකල්ප | 05 | 03 |
| II. | ඉල්ලුම, සැපයුම සහ වෙළෙඳපොල සමතුලිතතාව | 15 | 09 |
| III. | නිෂ්පාදන න්‍යාය, පිරිවැය සහ ලාභ උපරිමකරණය කිරීම | 10 | 06 |
| IV. | වෙළෙඳපොල ව්‍යුහයන් | 10 | 06 |
| V. | සාර්ව ආර්ථික විද්‍යාවේ අංග | 10 | 06 |

### I. ආර්ථික විද්‍යාවේ මූලික සංකල්ප (05% - පැය 3)

ආර්ථික විද්‍යාව, ක්ෂද්‍ර ආර්ථික විද්‍යාව සහ සාර්ව ආර්ථික විද්‍යාව පිළිබඳ නිර්වචනයන්; හිඟකම සහ ආවස්ථික පිරිවැය, නිෂ්පාදන හැකියා වක්‍ර.

### II. ඉල්ලුම, සැපයුම සහ වෙළෙඳපොල සමතුලිතතාව (15% - පැය 09)

ඉල්ලුම, ඉල්ලුමට බලපාන සාධක, ඉල්ලුම් ලේඛනය සහ ඉල්ලුම් න්‍යාය, ඉල්ලුම් වක්‍රය දිගේ චලනය වීම සහ විතැන්වීම

සැපයුම, සැපයුමට බලපාන සාධක, සැපයුම් ලේඛනය සහ සැපයුම් න්‍යාය, සැපයුම් වක්‍රය දිගේ චලනය වීම සහ විතැන්වීම

ඉල්ලුම සහ සැපයුම සංයෝගයෙන් වෙළෙඳපොල සමතුලිතතාව තීරණය කිරීම, ඉල්ලුම් සැපයුම් වක්‍ර විතැන්වීම සහ සමතුලිතතාවට බලපෑම.
මිල නම්‍යතාව, නම්‍යතා සංගුණකය සහ සම්බන්ධතා.

### III. නිෂ්පාදන න්‍යාය, පිරිවැය සහ ලාභ උපරිමකරණය කිරීම (10% - පැය 06)

විචල්‍ය සහ ස්ථාවර යෙදවුම් (උදා. ශ්‍රමය සහ ප්‍රාග්ධනය) සහ නිෂ්පාදනයේ කෙටිකාලීන සහ දිගුකාලීන වෙනස්වීම්; මුළු නිෂ්පාදිතය, සාමාන්‍ය නිෂ්පාදිතය සහ ආන්තික නිෂ්පාදිතය සහ හීනවන ආන්තික ඵලදා න්‍යාය. කෙටිකාලීන සහ දිගුකාලීන නිෂ්පාදන පිරිවැය අතර වෙනස සහ ලාභ උපරිම කිරීමේ කොන්දේසි.

### IV. වෙළෙඳපොල ව්‍යුහයන් (10% - පැය 06)

වෙළෙඳපොල ව්‍යුහයන්ගේ ලක්ෂණ: පූර්ණ තරඟය, ඒකාධිකාරය, ඒකාධිකාරී තරඟය සහ කතිපයාධිකාරය; විවිධ වෙළෙඳපොල ව්‍යුහයන් යටතේ ලාභ උපරිම කිරීම.

### V. සාර්ව ආර්ථික විද්‍යාවේ අංග (10% - පැය 06)

සාර්ව ආර්ථිකවිද්‍යා විචල්‍යයන් හඳුන්වාදීම: උද්ධමනය, රැකියා වියුක්තිය, ආර්ථික වෘද්ධිය, විනිමය අනුපාත; ද්වි-අංශ ආර්ථිකයක් සඳහා චක්‍රාකාර ප්‍රවාහ සටහන; ජාතික ආදායම සහ එහි ගණනය කිරීම්; රජයේ සාර්ව ආර්ථික අරමුණු ලෙස පිස්කල් සහ මූල්‍ය ප්‍රතිපත්තිය.

#### ඇගයීම

පාඩම් ඒකකය අවසානයේ පහත සඳහන් සංයෝගය සහිතව විනාඩි 90ක (පැය 1 ½) ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

| ක්‍රමය | ලකුණු |
|---|---|
| බහුවරණ ප්‍රශ්න 12ක් | 24 |
| එක් අනිවාර්ය ප්‍රශනයක් | 16 |
| ප්‍රශ්න තුනකින් ලකුණු 10ක එක් ප්‍රශ්නයක් | 10 |
| **මුළු ලකුණු** | **50** |

#### *ඉගෙනුම් ආධාරක*

**ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයන පැකේජය,** *CMA Sri Lanka, 2024*
*Sloman, J & Wride, A 2021,* ***Economics*** *(10th Ed.), Prentice Hall, London.*

### කළමනාකරණය

සෑම කළමනාකරුවකුටම කළමනාකරණයේ මූලධර්ම සහ ක්‍රියාවලිය පිළිබඳ විස්තීර්ණ දැනුමක් තිබීම අවශ්‍ය වෙයි. සීමිත සම්පත් සාර්ථක ලෙස භාවිතා කරමින් නිශ්චිත ඉලක්ක සහ අරමුණු පිහිටුවීමේ සහ ඒවා අත්පත් කරගැනීමේ කාර්යය සඳහා මෙම දැනුම ඔහුට උදව් වෙයි. මෙම පාඩම් ඒකකයේ අරමුණ වන්නේ සංයුක්ත පාලනය සහ ආචාරධර්ම සමග කළමනාකරණයේ සංකල්ප, මූලධර්ම සහ පරිචයන් පිළිබඳ මූලික අවබෝධයක් සිසුන්හට ලබාදීමයි.

### ඉගෙනුම් ඵල

පාඩම් ඒකකය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම සමග සිසුන්හට;

a) කළමනාකරණයේ මූලධර්ම සහ සංකල්ප විස්තර කිරීමට,
b) මූලික කළමනාකරණ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී කළමනාකරුවන්ගේ භූමිකාව පැහැදිලි කිරීමට,
c) සංවිධාන තුළ සංයුක්ත පාලනය සහ ආචාර ධර්මවල භූමිකාව සාකච්ඡා කිරීමට,
d) කළමනාකරණ අධ්‍යයනයන් පිළිබඳ උසස් අධ්‍යයනය කරගෙන යාමේ හැකියාව විදහා දැක්වීමට හැකිවනු ඇත.

**පාඩම් ඒකකයේ ස්වභාවය:** අනිවාර්ය, එකිනෙකට බලපාන පැයවලින් යුත් පැය හැටකින් සමන්විත වෙයි.

### විෂය නිර්දේශ ව්‍යුහය

| අංශය | ක්ෂේත්‍රය | බරතැබීම (%) | කාලය පැය |
|---|---|---|---|
| I. | කළමනාකරණය හැඳින්වීම | 10 | 06 |
| II. | කළමනාකරණ කාර්යයන් | 30 | 18 |
| III. | සංයුක්ත පාලනය සහ ආචාරධර්ම | 10 | 06 |

### I. කළමනාකරණය හැඳින්වීම (10% - පැය 06)

කළමනාකරණය, සඵලත්වය, කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව නිර්වචනය කිරීම: සංවිධානය, එහි පරිසරය සහ කළමනාකරණ ක්‍රියාවලිය; කළමනාකරණ ධූරාවලිය, භූමිකා සහ කුසලතා මට්ටම.

### II. කළමනාකරණ කාර්යයන් (30% - පැය 18)

කළමනාකරණ කාර්යයන් සහ ඒවායේ අන්තර් සම්බන්ධතාව පිළිබඳ සමස්ථ විග්‍රහය,

සැලසුම් කිරීම: සැලසුම් කිරීමේ මූලධර්ම - ඉලක්ක, අරමුණු සහ උපායමාර්ග; සැලසුම් කිරීමේ සීමා; උපායමාර්ගික සැලසුම්, මෙහෙයුම් සැලසුම් සහ අසම්භාව්‍ය සැලසුම්; දැක්ම, මෙහෙවර, ඉලක්ක සහ අරමුණු ස්ථාපිත කිරීම.

සංවිධානය කිරීම: අධිකාරිය, පැවරීම, වගකීම සහ වගවීම; සංවිධාන ව්‍යුහය - වැදගත්කම සහ මූලික අංග; සංවිධාන ව්‍යුහ වර්ග (ශ්‍රිතීය, ආංශික, මිශ්‍ර සහ න්‍යාස); සන්දර්භය සහ සංවිධානමය සැලැස්ම; කාර්යමණ්ඩලකරණය සහ මානව සම්පත් සැලසුම් කිරීම.

මෙහෙයවීම: අභිප්‍රේරණය - සංකල්ප සහ ක්‍රියාවලිය, අභිප්‍රේරණය පිළිබඳ මැස්ලෝ න්‍යාය;

සන්නිවේදනය: ක්‍රියාවලිය, වර්ග, ශිල්පීයක්‍රම සහ ඒවායේ සඵලතාව; නායකත්වය සහ නායකයා: ගති ලක්ෂණ සහ චර්යා ප්‍රවේශය, ඒකාධිපති සහ ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ලක්ෂණ.
පාලනය: පාලනයේ ස්වභාවය, ක්‍රියාකාරකම්, කාර්යයන් සහ මට්ටම්; පාලන උපායමාර්ග - වෙළෙඳපොල, නිලධාරිවාදී සහ ගෝත්‍රික; පාලනයේ විෂම ප්‍රතිවිපාක.

### III. සංයුක්ත පාලනය සහ ආචාරධර්ම (10% - පැය 06)

සංකල්පය; සම්බන්ධිත පාර්ශව සහ සංයුක්ත පාලනයේ මූලධර්ම.
ආචාරධර්ම සංකල්පය; පාලන කණ්ඩායමේ ආචාරධර්ම, කාර්යස්ථානය සහ පුද්ගලයින්; වෘත්තීය ආචාරධර්ම.

### ඇගයීම

පාඩම් ඒකකය අවසානයේ පහත සඳහන් සංයෝගය සහිතව විනාඩි 90ක (පැය 1 ½) ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

| ක්‍රමය | ලකුණු |
|---|---|
| බහුවරණ ප්‍රශ්න 12ක් | 24 |
| එක් අනිවාර්ය ප්‍රශනයක් | 16 |
| ප්‍රශ්න තුනකින් ලකුණු 10ක එක් ප්‍රශ්නයක් | 10 |
| **මුලු ලකුණු** | **50** |

### *ඉගෙනුම් ආධාරක*

**කළමනාකරණය පිළිබඳ අධ්‍යයන පැකේජය** - *CMA Sri Lanka, 2024*
*Stoner, JAF, Freeman, ER & Gilbert, DR (Jr.), 2004,* ***Management*** *(6th Ed.), Pearson Education, New York.*

## CAT 4: ප්‍රමාණාත්මක ක්‍රම (QM)

ව්‍යාපාරික සංවිධානයක දෛනික කාර්යයන්හිදී ප්‍රමාණාත්මක ක්‍රම වැදගත් භූමිකාවක් ඉටුකරයි. ව්‍යාපාරයෙහි ප්‍රමාණාත්මක ක්‍රම ගොඩනැගීමේ පද්ධතිය මූලික ගණිතයෙන් සංඛ්‍යානයෙන් සහ මූල්‍ය ගණිතයෙන් සමන්විත වෙයි. මෙම පාඩම් ඒකකයේ අරමුණ වන්නේ සංඛ්‍යාන සහ මූල්‍ය ගණිත ක්ෂේත්‍රයන්ගෙන් තෝරාගත් යෙදවුම් අනුව යමින් ගණිතයෙහි මූලික සංකල්ප පිළිබඳව අවබෝධයක් සිසුන්හට ලබා දීමයි.

### ඉගෙනුම් ඵල

පාඩම් ඒකකය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමත් සමග සිසුන්හට;

a) මූලික ගණිතයෙහි, සංඛ්‍යානයෙහි සහ මූල්‍ය ගණිතයෙහි සංකල්ප විස්තර කිරීමට,
b) ගණිතය, සංඛ්‍යානය සහ මූල්‍ය ගණිතය පිළිබඳ තෝරාගත් යෙදවුම් නිරූපණය කිරීමට,
c) පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකරණය පිළිබඳ උසස් අධ්‍යයනයන් කරගෙන යාමේ හැකියාව විදහා දැක්වීමට හැකිවනු ඇත.

**පාඩම් ඒකකයේ ස්වභාවය:** අනිවාර්ය, එකිනෙකට බලපාන පැයවලින් යුත් පැය හැටකින් සමන්විත වෙයි.

### විෂය නිර්දේශ ව්‍යුහය

| අංශය | ක්ෂේත්‍රය | බරතැබීම (%) | කාලය පැය |
|---|---|---|---|
| I. | ව්‍යාපාර සඳහා මූලික ගණිතය | 40 | 24 |
| II. | තෝරාගත් සංඛ්‍යානමය යෙදවුම් | 40 | 24 |
| III. | මූල්‍ය ගණිතය හැඳින්වීම | 20 | 12 |

### I. ව්‍යාපාර සඳහා මූලික ගණිතය (40% - පැය 24)

දර්ශකද ඇතුලුව වීජගණිතය පිළිබඳ නීති, සුලු කිරීම සහ සාධකවලට බෙදීම; වීජගණිතමය සමීකරණ: සරල, සමගාමී සහ වර්ගජ; වීජගණිතමය ශ්‍රිතයන්; සමාන්තර සහ ගුණෝත්තර ශ්‍රේණි සහ යෙදවුම්; අසමානතා.

ප්‍රභේදනය, සංකලනය සහ යෙදවුම්: එකතුව, ඵලය, ලබ්ධිය සහ ශ්‍රිතයක ක්‍රියාකාරිත්වය සඳහා ආන්තර සංගුණකය; ද්විතීය ආන්තර සංගුණකය, උපරිමය සහ අවමය තීරණය කිරීම සහ ශ්‍රිතික ප්‍රස්තාර (උදා. ආදායම, පිරිවැය ලාභ ප්‍රස්තාර). මූලික ශ්‍රිතයන්ගේ සංකලනය.

### II. තෝරාගත් සංඛ්‍යානමය යෙදවුම් (40% - පැය 24)

සංඛ්‍යානය, සංඛ්‍යානමය ක්‍රියාවලිය සහ භාවිතය.

සංඛ්‍යාත ව්‍යාප්තීන් සහ දත්ත ඉදිරිපත් කිරීම: දත්ත එරෙහිව තොරතුරු; ප්‍රාථමික සහ ද්විතීක දත්ත, සමූහික සහ අසමූහික දත්ත. සංඛ්‍යාත ව්‍යාප්තීන්: විවික්ත සහ අවිච්චින්න, ජාලරේඛ, සංඛ්‍යාත බහුඅශ්‍රය සහ සංඛ්‍යාත ව්‍යාප්ති රේඛා.

කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් (මධ්‍යන්නය, චතුර්තකය සහ මාතය) සහ අපකිරණ (පරාසය, සම්මත අපගමනය සහ අන්තර් චාතුර්තක පරාසය) සහ යෙදවුම්.

දත්ත ඉදිරිපත් කිරීම: වගු සහ සටහන් (ප්‍රස්තාර, ඇඳි සටහන් සහ සිතිලි).
සම්බන්ධතාව: විචල්‍යයන් දෙකක් අතර සහසම්බන්ධය, මිනුම් (විසිරි තිත් සටහන්, පියර්සන් සංගුණකය) සහ අර්ථනිරූපණය, හේතුකාරකය සහ ව්‍යාජ සම්බන්ධතා.

### III. මූල්‍ය ගණිතය හැඳින්වීම (20% - පැය 12)

සුළු පොලිය සහ වැල්පොලිය; මුදල් ප්‍රවාහ සහ ආවස්ථික පිරිවැයක් ලෙස පොලිය, අනාගත අගය සහ වර්තමාන අගය; තීරණ ගැනීමේදී වර්තමාන අගය පිළිබඳ මූලික යෙදවුම් (මුදල් ගලායෑම් සහ ගලා ඒම් ඇතුලුව).

### ඇගයීම

පාඩම් ඒකකය අවසානයේ පහත සඳහන් සංයෝගය සහිතව පැය තුනක ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

| ක්‍රමය | ලකුණු |
|---|---|
| බහුවරණ ප්‍රශ්න 25ක් | 50 |
| එක් අනිවාර්ය ප්‍රශනයක් | 20 |
| ප්‍රශ්න හතරකින් දෙකක් - එකකට ලකුණු 15 බැගින් | 30 |
| **මුලු ලකුණු** | **100** |

### *ඉගෙනුම් ආධාරක*

**ප්‍රමාණාත්මක ක්‍රම පිළිබඳ අධ්‍යයන පැකේජය -** *CMA Sri Lanka, 2024*
*Anderson, DR, Sweeney, DJ & William, TA 2015,* ***Quantitative Methods for Business*** *(13th Ed.), South Western College Publishing.*

## කුසලතා පාඨමාලාව

## CAT 5: තොරතුරු තාක්ෂණය (IT)

මෙය තොරතුරු තාක්ෂණයට අදාල මූලික න්‍යායෙන් සහ පරිචයෙන් සමන්විත හඳුන්වා දීමේ මට්ටමේ පාඩම් ඒකකයකි. සංවිධානමය පරිසරයක නිරන්තරයෙන් භාවිතා වන පද සකසන මෘදුකාංග, පැතුරුම් පත් මෘදුකාංග සහ ඉදිරිපත් කිරීමේ මෘදුකාංග පිළිබඳ ප්‍රායෝගික දැනුම සහ මෙහෙයුම් කුසලතා මෙම මොඩියුලය මගින් සපයනු ලබයි.

### ඉගෙනුම් ඵල

මෙම පාඩම් ඒකකය සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමත් සමග සිසුන්හට;

a) ව්‍යාපාරයක තොරතුරු තාක්ෂණය සහ එහි යෙදවුම් පිළිබඳ දැනුම විදහා දැක්වීමට,
b) මූලික ලියවිලි නිර්මාණය කිරීම පිළිබඳ දැනුම විදහා දැක්වීමට,
c) පැතුරුම් පත් භාවිතය පිළිබඳ දැනුම විදහා දැක්වීමට,
d) ඉදිරිපත් කිරීමේ මෘදුකාංග භාවිතය පිළිබඳ දැනුම විදහා දැක්වීමට හැකිවනු ඇත.

### විෂය නිර්දේශ ව්‍යුහය

න්‍යාය සහ ප්‍රායෝගික මොඩියුලයන් සඳහා පාඩම් ඒකකය තුළ ආවරණය වන ප්‍රධාන මාතෘකා සහ ඒවායේ සාපේක්ෂ බරතැබීම.

| න්‍යාය මොඩියුලය | | | |
|---|---|---|---|
| අංශය | | බරතැබීම (%) | කාලය පැය |
| A. පද සැකසීම | | 10 | 05 |
| B. පැතුරුම් පත් | | 10 | 05 |
| C. ඉදිරිපත් කිරීම | | 10 | 05 |
| | එකතුව | **30** | **15** |
| **ප්‍රායෝගික මොඩියුලය** | | | |
| අංශය | | බරතැබීම (%) | කාලය පැය |
| A. පද සැකසීම | | 20 | 10 |
| B. පැතුරුම් පත් | | 40 | 30 |
| C. ඉදිරිපත් කිරීම | | 10 | 05 |
| | එකතුව | **70** | **45** |

### I. පද සැකසීම (30%)

පද සකසන මෘදුකාංග භාවිතය විදහා දැක්වීම.

පද සකසන මෘදුකාංග වර්ග; පද සැකසුම් භාවිතා කරන අවස්ථා; නව ගොනුවක් නිර්මාණය කිරීම; පවත්නා ගොනුවක් විවෘත කිරීම සහ අනෙකුත් කාර්යයයන්; ඡේද සහ පිටු ආකෘතිකරණය; අකුරු සහ ව්‍යාකරණ පරීක්ෂාව; පින්තූර සහ පසුරු සිත්තම්; වගු; බහුවිධ තීරු;

ගොනු ඇතුළත් කිරීම; ලිපි ඒකාබද්ධ කිරීම; මුරපද සහ පථ වෙනස්කම් පැවැත්වීම සහ මුද්‍රණය කිරීම.

## II. පැතුරුම් පත් (50%)

පැතුරුම් පත් භාවිතය විදහා දැක්වීම.

පැතුරුම් පත් භාවිතා කරන අවස්ථා; පැතුරුම් පත් ආකෘතිකරණය; මූලික ගණනය කිරීම්; සටහන්; තාර්කික ක්‍රියාකාරකම්; මූල්‍ය ශ්‍රිතයන්; සංඛ්‍යානමය ශ්‍රිතයන්; වර්ගකිරීම; පෙරීම; මුද්‍රණය; සංඛ්‍යාතීන් සහ සවිස්තරාත්මක සංඛ්‍යා (කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් සහ අපකිරණ) සහ සහසම්බන්ධතා සහ ප්‍රතිපායන විශ්ලේෂණය.

පැතුරුම්පත් ආකෘතීන් සංවර්ධනය කිරීම.

පැතුරුම් පත් මූලධර්ම සහ විගණන මෙවලම් හඳුන්වාදීම; පැතුරුම් පත් තීරණ තර්කනයන්; පැතුරුම් පත් ආකෘතීන්හි වැදගත් මෙවලම්; කේන්ද්‍රීය වගු භාවිතය; සංවේදිතා විශ්ලේෂණය; විසඳීම; කොන්දේසිගත ආකෘතිකරණය, වර්ගකිරීම, වගු සහ දත්ත වලංගුභාවය, ණය ක්‍රමක්ෂය ආකෘතීන්, ක්ෂය කිරීම් සහ ව්‍යාපාරික විශ්ලේෂණය සඳහා සටහන් සංවර්ධනය කිරීම.

## III. ඉදිරිපත් කිරීම (20%)

ඉදිරිපත් කිරීමේ මෘදුකාංග භාවිතය විදහා දැක්වීම.

ඉදිරිපත් කිරීම භාවිතාවන අවස්ථා; සඵල ඉදිරිපත් කිරීමක් සඳහා කාර්යයන් සහ හෝඩුවාවන්; ඉදිරිපත් කිරීමක් ආකෘතිකරණය කිරීම; සජීවීකරණය; වගු; සටහන්; ප්‍රධාන ලිහිසනය පාලනය කිරීම සහ මුද්‍රණය.

### ඇගයීම

පාඩම් ඒකකය අවසානයේ පහත සඳහන් සංයෝගය සහිතව පැය තුනක ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

| ක්‍රමය | ලකුණු |
|---|---|
| බහුවරණ ප්‍රශ්න 20ක් | 40 |
| එකකට ලකුණු 20 බැගින් පැතුරුම් පත්වලින් ප්‍රායෝගික ප්‍රශ්න දෙකක් | 40 |
| එකකට ලකුණු 10 බැගින් MS. Word සහ MS. Power Point වලින් ප්‍රායෝගික ප්‍රශ්න දෙකක් | 20 |
| මුළු ලකුණු | **100** |

### ඉගෙනුම් ආධාරක

**තොරතුරු තාක්ෂණය පිළිබඳ අධ්‍යයන පැකේජය** - *CMA Sri Lanka, 2024*

*Charles, RS 2015, **Introduction to Networking: How the Internet Works**, Kindle Edition*



CAT Certified Accounting Technologist

# අධ්‍යයන වැඩසටහන

**ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය**
ශ්‍රී ලංකා ජාතික වෘත්තීය කළමනාකරණ ගණකාධිකරණ ආයතනය
විශාඛා පෞද්ගලික පාර, කොළඹ 04, ශ්‍රී ලංකාව
දුරකථන : +94 (0) 11 2506391, 2507087, 4641701-3, ෆැක්ස් : Ext 118
www.cma-sri lanka.org
examinations@cma-srilanka.org

ISBN978-955-0926-07-7